# අස්ගිරි මහාවිහාරය සහ 1818 පළමු නිදහස් සටන



සංස්කරණය

ඇටිපොල මහින්ද හිමි
කැටකුඹුරේ ධම්මාරාම හිමි
ඇහැලේපොල මහින්ද හිමි
අජිත් තල්වත්ත

Scanned with CamScanner

මෙහි දැක්වෙන ලිපිවල අයිතිය ඒ ඒ කතුවරු සතුවන අතර එම ලිපිවල අන්තර්ගතය පද බෙදීම, අක්ෂර වින්‍යාශය ආදි සියලු කරුණු සම්බන්ධව වගකීම ද ඒ ඒ කතුවරු සතුය.

අස්ගිරි මහාවිහාරය සහ 1818 පළමු නිදහස් සටන

© ශාස්ත්‍රපති ඇටිපොල මහින්ද හිමි, දර්ශනපති කැටකුඹුරේ ධම්මාරාම හිමි, රාජකීය පණ්ඩිත ඇහැල්පොල මහින්ද හිමි, ආචාර්ය අජිත් තල්වත්ත

පළමු මුද්‍රණය - 2019

ISBN - 978-955-1478-01-8

පරිගණක පිටු සැකසුම - ජී. එච්. ජී. මහේෂිකා මධුභාෂිණී
- රාජකීය පණ්ඩිත ඇහැල්පොල මහින්ද හිමි

කඤ්චුකය නිර්මාණය - ආචාර්ය සුදර්ශන බණ්ඩාර

කවරයේ සිතුවම - එච්. ජී. සඳුන් ප්‍රභාත් කුලරත්න

ප්‍රකාශනය - අස්ගිරි මහාවිහාරය, අස්ගිරිය, මහනුවර.

මුද්‍රණය - ක්‍රියේටිව් ප්‍රින්ටර්ස් පුද්ගලික සමාගම, මහනුවර.

# මහාවිහාර සම්ප්‍රදාය හා එහි සැලැස්ම

ඩී. තුසිත මැන්දිස්

## හැඳින්වීම

මූලාශ්‍රයගත තොරතුරු අනුව අනුරාධපුරයේ ස්ථානගත වන බෞද්ධ සංඝාරාම අතර පැරණිත ම ආරාම විශේෂය වශයෙන් මහාවිහාරය පෙන්වා දිය හැකි ය. අනුරාධපුරයේ දැකිය හැකි මහාවිහාර සම්ප්‍රදායේ විහාරයන්හි ස්ථානගත වීම දෙස බැලීමේ දී, ඇතුළුපුරයට දකුණු දිගින් මහාවිහාරයත්, නැගෙනහිරින් ජේතවනයත්, උතුරින් අභයගිරියත්, බටහිරින් මිරිසවැටියත්, නිරිතදිගින් දක්ෂිණ විහාරයත් පිහිටා තිබේ.[1] මේ එක් එක් විහාර ගොඩනංවන ලද්දේ එක ම කාලයක නොව ශතවර්ෂ ගණනාවක් තුළ දී බව මූලාශ්‍රය අධ්‍යයනයේ දී පැහැදිලි වේ. මහාවංසයේ දක්වා ඇති විස්තරවලට අනුව අනුරාධපුරයේ මුලින් ම ඉදිවන ආරාමය තිස්සාරාමය බව සඳහන් වේ.[2] තිස්සාරාමය ඇතුළත් මහමෙව්නා උයන දේවානම්පියතිස්ස රජතුමා මහින්ද මහරහතන් වහන්සේට පිළිගැන්වීමෙන් අනතුරු ව එහි ඉදි වූ මුල් ම විහාරය මහාවිහාරය වශයෙන් පසු ව ව්‍යවහාරයට පත් වී ඇත.[3] මහින්ද මහරහතන් වහන්සේට දේවානම් පියතිස්ස රජතුමා විසින් පූජා කරන ලද මහාමෙව්නා උයන පුරයට දකුණු දිගින් පිහිටි බව මහාවංසයේ හා දීපවංසයේ සඳහන් වේ.[4] මහමෙව්නා උයන වැටකින් මනාව සුරක්ෂිත කරන ලදුව දොරටුවලින් සමන්විත වූ බව ක්‍රි.ව. සිව් වැනි ශත වර්ෂයේ ලියැවුණු දීපවංසයේ සඳහන් වේ.[5]

## විමර්ශනය

මහාවිහාරයේ පිහිටීම හා එහි භූ දර්ශනය අධ්‍යයනයේ දී එහි සීමා මායිම්වල පිහිටීම පිළිබඳ ව විමර්ශනය කිරීමේ දී එහි උතුරු සීමාව ථූපාරාමයට ආසන්න ව රුවන්වැලි සෑය දෙසට වූ බවට සාක්ෂ්‍ය ඇත. මහාවිහාරයත්, ථූපාරාමයත් විහාර දෙකක් බව මහාවංසයේ සඳහන් වන බැවින්[6] ථූපාරාම දාගැබේ සිට තවත් දකුණු දෙසට වන්නට මහාවිහාර උතුරු සීමාව පිහිටුවා තිබෙන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. මහාවිහාරයේ බටහිර සීමාව වූයේ අභයවාපි (බසවක්කුලම) හා දකුණු සීමාව ශ්‍රී මහා බෝධියටත් දක්ෂිණ ථූපයටත්

1 සිල්වා, රෝලන්ඩ්. 1998., "අනුරාධපුර නගරය හා තදාශ්‍රිත ආගමික සිද්ධස්ථානවල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ", අපේ සංස්කෘතික උරුමය (ද්විතය භාගය), කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය, 1998, 55 පිට.

2 මහාවංසය (පාලි), 1959., සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, 1959, පරි.15, ගාථා 223.

3 කුලතුංග, ටී.ජී.1998., අභයගිරි ස්තූපය හා ආරාම සංකීර්ණය, අපේ සංස්කෘතික උරුමය (ද්විතීය භාගය), මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය, 1998, 01 පිට.

4 මහාවංසය, පරි.15, ගාථා 11-12., දීපවංසය, සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, 1959,පරි.8, ගාථා 15.

5 දීපවංසය, පරි.15, ගාථා 15-20.

6 මහාවංසය, පරි.15, ගාථා 17.



Scanned with CamScanner

අතර බව පෙනේ. ශ්‍රී මහා බෝධියට දකුණින් යාර 150 ක් පමණ දුරින් ඇති ප්‍රාකාරය එහි පැරණි සීමා ප්‍රාකාරය බව විශ්වාස කළ හැකි අතර ක්‍රි.ව. දෙ වැනි ශත වර්ෂයේ මළුතිස් (කනිට්ඨතිස්ස) රජතුමා මෙම ප්‍රාකාරයේ කොටසක් ඉවත් කර දක්ෂිණ ථූපයට යාමට මාර්ගයක් සකස් කළ බව මහාවංසයේ සඳහන් වේ.[7] එසේ ම මහාවිහාරයේ නැගෙනහිර සීමාව ජේතවන විහාරයේ සීමාව වෙන් කෙරෙන වර්තමාන හාල්පානු ඇළට බටහිරින් පිහිටන මාර්ගය දෙසින් වන සීමා ප්‍රාකාරය බව හඳුනාගත හැකි ය.

පසුගිය වසර කිහිපය තුළ මහාවිහාරයේ නැගෙනහිර පවුර ආශ්‍රිත ව සිදු කරන ලද කැණීම්වල දී ප්‍රාකාරයේ ගල් පුවරුවක තිබී ක්‍රි.ව. හය වැනි ශත වර්ෂයට පමණ අයත් බ්‍රාහ්මී අක්ෂරයෙන් රචනා කර ඇති ලිපියක දෙවනවිහරසිම්(ජේතවනාරාමයේ සීමාව) වශයෙන් සඳහන් කර තිබීම තුළින් මහාවිහාරය හා ජේතවනය නැගෙනහිර සීමාව නිර්ණය කළ හැකි ය. එසේ ම මහාවංසයේ සඳහන් වන සේන ගුත්තික ද්‍රවිඩ පාලකයින් විසින් අනුරාධපුර නගරයට ජලය ලබාගැනීමට ඉදිකළ දෙවැනි කොලොම්හොය මෙම උභය විහාරවල සීමා නිර්ණයට ද බලපාන්නට ඇත.[8] වර්තමාන හාල්පානු ඇළ වශයෙන් හැඳිනගත හැකි මෙම ඇළ ආශ්‍රිත ව ජේතවන සීමාවේ වයඹ දෙසින් ඇළ හරහා වූ පැරණි ගල්පාලමක සළකුණු දක්නට ලැබේ.[9] එම පුරාවිද්‍යා සාධක අනුව මෙම ඇළ පුරාණයේ සිට ක්‍රියාත්මක වූ බව පැහැදිලි වන බැවින් දෙවැනි කොළොම්හොය මෙම ඇළ විය හැකි බව උපකල්පනය කළ හැකි ය. මහාවංසයේ සඳහන් වන තවත් පුවතක් අනුව ද මහසිළු මහතිස් රජු දවස වණ්ණක මහමොවු ඇළ ද, නුවර සත් රියනක් උස් පවුර ද, පරිඛාව ද කළ බව සඳහන් වේ.[10] වණ්ණක යන්න මගින් වෙළඳ යන්න ගම්‍ය වන බැවින් සේන සහ ගුත්තික සමයේ ඉදි කරන ලද මෙම ඇළ පසු ව අනුරාධපුර නගරයේ වෙළඳ කටයුතු සමඟ බද්ධ වී වණ්ණක ඇළ වශයෙන් ව්‍යවහාරයට පැමිණීමට ඇතැයි ද උපකල්පනය කළ හැකි ය. එසේ ම නගරයේ ජලය ඉවතට ගැනීමට පරිඛාව ඉදි කළ බව සඳහන් වීමෙන් නගරයේ අතිරික්ත ජලය පිටකිරීමට යෙදූ මාර්ගයක් පිළිබඳ ව සඳහන් වේ. වැසි සමයේ දී හෝ දෛනික ව විහාරාරම හා නාගරික කටයුතුවල දී අතිරික්ත ජලය පිටතට යැවීමේ දී මෙවැනි ඇළක් (වර්තමාන හාල්පානු ඇළ) නගරයට අත්‍යවශ්‍ය අංගයක් වීමට ඇති බව පෙන්වා දීය හැකි ය. මේ ආකාරයට පැරණි සීමා මායිම් මහාවිහාර ආශ්‍රිත ව දැක ගත හැකි ය.

දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ දී මහින්ද මහරහතන් වහන්සේ විසින් ශ්‍රී ලංකාවේ බෞද්ධාගම ස්ථාපිත කිරීමේ දී අනුරාධපුර භූ දර්ශනයට එක්කළ ප්‍රථම විහාරය ආරම්භයේ දී තිස්සාරාමය වශයෙන් හැඳින් වුව ද පසුව එය මහාවිහාරය නමින් ප්‍රකට විය.[11] මහින්ද මහරහතන් වහන්සේ විසින් දෙවන පැතිස් රජු සමඟ මහා සීමාව අභ්‍යන්තරයේ විහාරයකට අත්‍යවශ්‍ය ගොඩනැගිලි ස්ථාපිත වන ස්ථාන පෙන්වමින් ඉසින ලද මල් පතිත වීමෙන් මහාවිහාරයේ පූජනීය අංග ස්ථානගත වීම සමඟ මහාවිහාර සැලැස්ම ගොඩනැගේ. මේ පිළිබඳ ව මූලාශ්‍රයවල අන්ගතර්ගත විස්තරවලින් පූජනීය ස්ථාන අටක් මහාවිහාරයට අයත් වූ බව වංසකතාව විස්තර කර තිබේ. එම ස්ථාන වශයෙන් මහාවංසයේ දක්වා ඇත්තේ තිස්සාරාමය, ශ්‍රී මහා බෝධිය, රුවන්වැලිසෑය, ජන්තාඝර පොකුණ, ලෝවාමහාපාය,

7 මහාවංසය, පරි.36, ගාථා 13-14.

8 එම,පරි.35, ගාථා 206-207.

9 දැරණියගල,සිරාන් උපේන්ද්‍ර, පුරාවිද්‍යා කැණීම් 1890-1990, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය (ශත සංවත්සරය), පළමු වෙළුම, පරි. කේ.බී. ඒ.එඩ්මන්, කොළඹ, රජයේ මුද්‍රණ නිතිගත සංස්ථාව, 1990, 08 පිට.

10 මහාවංසය, පරි.34, ගාථා 33.

11 කුලතුංග, 2001,01 පිට.



Scanned with CamScanner

ලහබත්ගෙය, දානශාලාව (වතුශාලව), කම්මාලකය එම පූජනීය ස්ථානයන් ලෙස ය.[12] මූලාශ්‍රයන්හි පැරණි මහාවිහාරයට අයත් විහාර අංග ඇතුළත් ස්ථාන දක්වා ඇත්තේ මෙසේ ය.

- පිචුල මාලක (පුලිල මළුව) - සංඝකර්ම මාලකය රජගෙට දකුණින්[13]
- වාරු (වාරුත්ත) පොක්ඛරණී - ගිනිහල් පොකුණ[14] රජගෙයි දොරකොටුව
- (මහ මිදෙල් මළුව), ජය ශ්‍රී මහා බෝධිය උපෝසථඝරය සඳහා[15]
- පන්හම්භමාලකය (පැනඹුමළුව) පිරිකර ලාභ බෙදාගන්නා ස්ථානය සඳහා[16]
- චතුස්ශාලාව (දන්ගෙය)[17]
- කකුධවාපි (කුඹුක්කනම් කඳු බද ඉස්මත්ත) මහාථූපය සඳහා.[18]

මහින්ද මහරහතන් වහන්සේ දේවානම් පියතිස්ස රජතුමා කැටුව මල් ඉසිමින් පොළොව කම්පාවන ස්ථානයන්හි විහාරයකට අයත් ප්‍රධාන ගොඩනැගිලි ස්ථානගතවීම පිළිබඳ ව කරුණු කාරණා මෙසේ පෙන්වා දී ඇති බව සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වේ. මෙම ස්ථාන තෝරා ගැනීමෙන් අනතුරු ව මුලින් ම ඉදිවන මහාවිහාරයේ සැලැස්ම හා එහි ස්ථානගත වන ගොඩනැගිලි හා ගොඩනැගෙන විහාර සැලැස්ම මූලාශ්‍රයගත තොරතුරුවලින් මැනවින් විස්තර කර තිබේ. මිහිඳු මහ හිමියන් දේවානම්පියතිස්ස රජුට ගොඩනැගිලි ඉදිකිරීමට අවශ්‍ය ස්ථාන පෙන්වා දීමෙන් හා ඉදිවන ගොඩනැගිලි පිළිබඳ ව පහදාදීම තුළින් පසු කලෙක අනුරාධපුර ශුද්ධ නගරය හැටියට සැළකුණු මුල් ම කොටසෙහි මුල් ම මහාවිහාර සැලැස්ම හා වින්‍යාසයකරන ලද්දේ මිහිඳු හිමියන් විසින් බව පෙනේ.[19] වංසකතාවල සඳහන් වන ප්‍රාතිහාර්යය පිළිබඳ ව විස්තර ද, මිථ්‍යා කතා ද කාව්‍යාලංකාර හා අතිශයෝක්තිය ද පැත්තකට කළ විට පැහැදිලි වන්නේ සංඝකර්ම සඳහා මාලකයක්, උණුදිය නෑම සඳහා පොකුණක්, ශ්‍රී මහා බෝධියට ස්ථානයක්, සංඝයාගේ උපෝසථ ශාලාවට ස්ථානයක්, බත්හලට සුදුසු ස්ථානයක් හා මහාථූපය සඳහා සුදුසු ස්ථානයක් පෙන්වමින් මිහිඳු මාහිමියන් දෙවනපෑතිස් රජු කැටුව යමින් පැහැදිලි කර දෙන ආකාරයයි. මෙමගින් අපට මහාවිහාරයක මූලික සැලැස්ම හඳුනාගත හැකි ය.[20]

මේ ආකාරයට ස්ථාපිත වූ මහාවිහාරයේ ගොඩනැගිලි ස්ථානගත වීම පිළිබඳ ව අධ්‍යයනයක යෙදෙන සේනක බණ්ඩාරනායක එම සැලැස්මේ සමහර ගොඩනැගිලි ස්ථානගතවීම පිළිගත හැකි බවත්, මහාථූපය, ලෝහ ප්‍රාසාදය යන ගොඩනැගිලි පිහිටීම පිළිබඳ ව ඓතිහාසික තොරතුරු එකිනෙකට සම්බන්ධතාවයක් නොදක්වන බව සඳහන් කර තිබේ[21]. දසවැනි සියවසේ රචිත මහබෝධිවංසයේ මහාවිහාරය ගොඩනැංවීම පිළිබඳ ව විස්තර සඳහන් ව තිබේ. එහි විස්තර වන ආකාරයට මහාවිහාරයේ සැලැස්ම සිංහ වික්‍රාන්ත නම් සැලැස්මකට අනුව ඉදි කරන ලද බව විස්තර කර ඇත. මහායාන වාස්තුවිද්‍යා ශිල්ප

12 එම, 1-2 පිට.
13 මහාවංසය, පරි.15, ගාථා 29, දීපවංසය, පරි.08, ගාථා 35-36.
14 මහාවංසය, පරි.35, ගාථා 31, දීපවංසය, පරි.08, ගාථා 39-42.
15 මහාවංසය, පරි.35, ගාථා 36-37, දීපවංසය, පරි.14, ගාථා 60-61.
16 මහාවංසය, පරි.38, ගාථා 46, දීපවංසය, පරි.14, ගාථා 63-34.
17 මහාවංසය, පරි.15, ගාථා 47- 50.
18 එම, පරි.15, ගාථා 52- 57.
19 රාහුල හිමි, වල්පොළ, ලක්දිව බුදු සමයේ ඉතිහාසය, කොළඹ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 57 පිට.
20 එම, 58 පිට.
21 Bandaranayake, S.1974., **Sinhalese Monastic Architecture: The Viharas of Anuradhapura**, Leiden, E.J.Brill, 1974, PP.47-48.



Scanned with CamScanner

ග්‍රන්ථයක් වූ මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍ර නම් ග්‍රන්ථයේ දැක්වෙන විහාරාරාම වර්ග විසි හතරින් එකක් ලෙස සිංහාරාම විහාර සැලැස්මට මහාවිහාරයට අයත් බව පෙන්වා දිය හැකි ය[22].

සිංහවික්‍රාන්ත ශෛලිය දාහතරවැනි සියවසේ රචිත ග්‍රන්ථයක් වන සද්ධර්මාලංකාරයේ හා බෝධිවංසයේ විස්තර කර තිබේ.[23] මූලාශ්‍රය තොරතුරු අනුව සිංහවික්‍රාන්ත සැලැස්ම අනුව ගොඩනැගී ඇති මහාවිහාරය පිළිබඳ ව එකිනෙකට පරස්පර මතවාද ගොඩනැගී තිබීම දැකගත හැකි ය. මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ දැක්වෙන විහාරාරාම වර්ග 24 න් එකක් වන සිංහවික්‍රාන්ත විහාර වින්‍යාසය සම අසමභාවයන් පිළිඹිමු කරන බව විමල විජයසූරිය ප්‍රකාශ කර ඇත. ඔහු පෙන්වාදෙන ආකාරයට සිංහාරාම වින්‍යාසයේ ද්වාරය බටහිරිනුත් මහාවිහාරයේ නැගනෙහිරිනුත් පිහිටා තිබීම පරස්පර ය. එසේ ම මහාවිහාරයේ ගොඩනැගිලි නවයෙන් බෝධිඝරය, සන්නිපාත ශාලා, ධාතුඝර, රංසිමාලක, භක්තශාලා, මහාථූපය මෙන් ම ප්‍රතිමාඝරය ද වැදහොත් සිංහයකුගේ අවයව පිහිටි තැන්වලට එක්කිරීම සිංහාරාම ක්‍රමය හා ගැළපෙන නමුත් පිළිමගෙය වැනි විහාර අංග එයට සම්බන්ධ කළ නොහැකි බව ද ඒවා පසු ව මහාවිහාර සැලැස්මට අයත් වන අංග බව ද පෙන්වා දී ඇත. පිළිමගෙය මහායානය මෙ රට ව්‍යාප්ත වූ පසු ඇතිවන අංගයකි.[24]

මහාවිහාරයේ මෙම ගොඩනැගිලි ඉදි කෙරුණේ කිසියම් සැලැස්මකට අනුව නොවන බව පෙන්වාදෙන මාරසිංහ එම ගොඩනැගිලි පිහිටා ඇති ආකාරය මංජු ශ්‍රී වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ විස්තර වන සිංහවික්‍රාන්ත සැලැස්මට බොහෝ දුරට සමාන වීම අහඹු සිදුවීමක් බව පිළිගැනීමට සිදු ව තිබේ.[25] තවත් සිංහල සම්භාව්‍ය ග්‍රන්ථයක් වන සද්ධර්මාලංකාරය මහාවිහාරය සිංහවික්‍රාන්ත සැලැස්මට අනුව නිර්මාණය කරන ලද්දේ දුටුගැමුණු රජතුමා බව දක්වයි.[26] සද්ධර්මාලංකාරය දක්වා ඇති අදහස් අනුව බොහෝ විට මහාවිහාරයට අයත් පැරණි ගොඩනැගිලිවලින් මහාථූපය, ලෝහ ප්‍රාසාදය ආදි ගොඩනැගිලි ඉදි කරනු ලබන්නේ දුටුගැමුණු රජතුමා විසිනි.[27] මෙවැනි මුල් ජනශ්‍රැතින් පිළිබඳ ව දෙවනපෑතිස් රජු හෝ දුටුගැමුණු රජු දැන සිටියේ ද යන්න සැක සහිත බැවින් බෝධිවංස විස්තරය මගින් ඒ වන විට ස්ථාපිත ව තිබුණු නිර්මාණයන් සම්බන්ධ සැලැස්මකට විද්‍යාත්මක පදනමක් ආරෝපණය කිරීම දැරූ උත්සාහයක් ලෙස සිංහවික්‍රාන්ත සැලැස්ම හඳුන්වා දිය හැකි ය.[28]

අනුරාධපුරය හා ඒ අවට බිහි වී පස්වැනි සියවසේ දී පමණ පූර්ණ වර්ධනයට පත් වූ ආරාම ප්‍රභේද අතරින් මහාවිහාරය පැරණිත ම ආරාම විශේෂය ලෙස මූලාශ්‍රයවල සඳහන් වේ. ක්‍රි.පූ. තුන් වැනි සියවස තරම් ඈත කාලයේ දී බිහිවන මහාවිහාරය තුළ ස්තූප, බෝධි, බෝධිඝර, උපෝසථඝර හා තරමක් පමා වී එම ගොඩට එකතු වූ පටිමාඝර යන ගොඩනැගිලි ඇතුළත් වීමෙන් ඒවා කලින් සකස් කරන ලද සැලැස්මක් අනුව නිර්මාණය

22 **Mahavamsa,** Tr.W.Giger, London, Oxford University Press, 1912, Ver. 230-232.

23 සිංහ වික්‍රාන්ති ශෛලිය සිංහල බෝධිවංශය විස්තර කර ඇත්තේ යම් සේ සිංහයාගේ වාලධි කෙළවර වැදහොත් තෙන මහාබෝධිගෙය වේ, දකුණුපය පිහිටි තෙන මහාප්‍රාසාදය වේ, වම්පය පිහිටි තෙන සන්නිපාත ශාලාව පිහිටි ගේ ද, නාබි ස්ථානයෙහි ධාතුගෙය ද, වම් ඇලයේ රංසිමාලකය ද, දකුණත පිහිටි තෙනහ චෛත්‍යය ද, ග්‍රීවය පිහිටි තෙන කණ්ඨ නම් පුෂ්කරණිය ද, පෙරළා දකුණැලයෙන් බලන්නාහු ඒ දාෂ්ටිය හුනු තැන පිළිමගෙය ද, එපරිද්දෙන් සිංහවික්‍රීඩිත යනුවෙනි (සිංබෝව. 209-210).

24 විජයසූරිය, විමල, මහාවිහාර සම්ප්‍රදාය, wfma ixialD;sl Wreuh, ප්‍රථම භාගය, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික හා අගමික කටයුතු අමාත්‍යාංශය, 1995, 87 පිට.

25 මාරසිංහ, වෝල්ටර්.මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍ර, නුගේගොඩ, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්, 1993, 15 පිට.

26 සද්ධර්මාලංකාරය,සංස්.මකුළුදූවේ පියරතන හිමි, කොළඹ, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, 1954, 409 පිට.

27 මහාවංසය, පරි.32, ගාථා 8-9.

28 මාරසිංහ, 1993, 15 පිට.



Scanned with CamScanner

වූ ඒවාදැයි කීමට විද්වතුන්ට හා පුරාවිද්‍යාඥයින්ට දුෂ්කර වී ඇත.[29] මහාබෝධිවංසය නම් පාලි කෘතියෙහි හා සද්ධර්මාලංකාරය නම් සම්භාව්‍ය සිංහල කෘතියේ මහාවිහාරය නිර්මාණය කරන ලද්දේ දෙවනපෑතිස් රජුගේ අණ පරිදි සිංහවික්‍රාන්ත සැලැස්මට යයි සඳහන් වේ.[30]

සිංහවික්‍රාන්ත සැලැස්ම තුළ මිහිඳු හිමියන් පෙන්වා දුන් ස්ථාන 7 න් සමහර ඒවා ඇතුළත් ව නැති අතර මෙය අවුල් සහගත කරුණක් බව මාරසිංහ ප්‍රකාශ කර ඇත.[31] එබැවින් පසුකාලීන ගත්කතුවරුන් මහාවිහාරයේ සැලැස්මට සිංහ යන නම ඈඳාගැනීම සිංහලයා සිංහයාගෙන් උපන් බව පෙන්වීමට සිංහ කොඩිය නිර්මාණය කිරීම වැනි කරුණක් ලෙස හැඳින්විය හැකි බව හෙට්ටිආරච්චිගේ මතය වේ.[32] මෙවැනි මූලාශ්‍රයගත තොරතුරුවල අන්තර්ගත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමෙන් පැහැදිලි වන්නේ ලක්දිව බිහි වූ ප්‍රථම ආරාමය වශයෙන් මූලාශ්‍රවල සඳහන් වන මහාවිහාරය එහි භූ දර්ශනය පුළුල් වීම සමඟ විවිධ සැලැසුම් තුළට අන්තර්ගත කර දැක්වීමට විවිධ කාලවල දී උත්සාහ දරා ඇති සෙයකි. කෙසේ වෙතත් විහාර සැලැස්ම සංවර්ධනය වීම සමඟ අනුරාධපුර රාජධානි සමය තුළ දී එහි භූ දර්ශනය වඩා පුළුල් වී යම්කිසි රටාවකට මහාවිහාරය හැඩගැසී ඇති ආකාරය මෙම කරුණු අනුව හඳුනාගත හැකි ය.

ලේඛනගත ප්‍රභවයන්ට අනුව අනුරාධපුරයේ මහාවිහාර කිහිපයක් බිහි වේ මහාවිහාරයෙන් අනතුරු ව මීලඟට බිහිවන මහාවිහාරය පිළිබඳ ව විමසීමේ දී වැදගත් වන විහාරයක් වන්නේ මිරිසවැටිය විහාරයයි. මහාවිහාරය ගොඩනැංවීමෙන් අවුරුදු සියයකට පසු දුට්ඨගාමිණී අභය මහරජතුමා (ක්‍රි.ව.161-137) විසින්එය ගොඩනගන ලද බව මහාවංසයේ සඳහන් වේ.[33](මහාවංසය)[34] මහාවිහාරයෙහි මෙන් නොව මිරිසවැටිය සංකීර්ණයෙහි නාභිගත ලක්ෂය වූයේ ස්තූපයයි. ඒ අනුව ස්තූපය වටා එක්තරා පිළිවෙලකට පෙහොයගෙය, පිළිමගෙය, උපෝසථඝරය, දානශාලාව, ප්‍රතිමාඝරය හා ලැගුම් ගෙවල් ස්ථානගත වන අතර මෙම සමය වන විට අනුරාධපුර දක්ෂිණ ප්‍රදේශය තුළමහාවිහාර සැලැස්මට අයත් ආරාම දෙකක්පුළුල් භූ දර්ශනයට එක් වී තිබෙණු දැකගත හැකි වේ.

---

29 එම.

30 එම, 14-15.

31 එම.

32 හෙට්ටිආරච්චි, ඒ.එස්. 1986., අනුරාධපුර මහා සීමාව, ***Ancient Ceylon No 6***, Journal of the Archaeological Survey Department of Sri Lanka .ed , Colombo, pub. by the commissioner of Archaeology Department. P. 56.

33 මහාවංසය, පරි.16, ගාථා 6-26. Silva, 2000, 56 පිට.

34 "සේසත් ඔප් නංවන ලද මඟුලින් යුත් සත්දවය ගිය කල්හි භයානිකාන්ත කළා වූ අභය නම් ඒ රජ තෙම කරන ලද රාජ අභිෂේකය ඇත්තෙන් ම ක්‍රීඩා කරනු පිණිස ද, අභිෂේක කරන ලද ක්ෂත්‍රියන්ගේ චාරිත්‍රය පාලනය කරනු පිණිස ද, මහා ක්‍රීඩා විධියෙන් මොනවට සරසන ලද්දා වූ තිසාවැවට සම්ප්‍රාප්ත වූයේ රජුගේ සියලු පරිභෝග භාණ්ඩ ද ජනයා ද ගෙනෙන ලද සිය ගණන් පවුරු ද, මිරිසවැටි වෙහෙර පිහිටන තැන්හි තැබූ හ. එහි ම ථූපය පිහිටන තැන්හි කුන්තායුධය උසුලන්නා වූ රාජ ආරක්ෂකයෝ ධාතු සහිත වූ කුන්තායුධය ඍජු කොට නැංවූ හ. මහරජ තෙම අන්තඃපුරවාසීන් සහිත වූයේ දිවා භාගයේ ජලයෙහි ක්‍රීඩා කොට සවස් වේලෙහි, භවන්ති ඔහු කුන්තායුධය වඩව් යයි කීයේ ය. රාජ පුරුෂයෝ ඒ කුන්තායුධය සොලවනු නොහැකි වූහ. මහත් ආශ්චර්යයක් දැක සතුටු සිත් ඇත්තේ කුන්තායුධය මැදිකොට දාගැබක් කරවූයේ ය. තුන් අවුරුද්දකින් නිම වූ වෙහෙර තෙමේ විහාර පූජා කාරණයෙන් සංඝයා රැස් කරවූයේ ය. එදවස රැස් වූ භිකෂූන් ලක්ෂයක් වූහ. භික්ෂූනීහු ද අනූදහසක් වූහ. මිහිපති තෙමේ ඒ සමාගමයෙහි සංඝයාට මගේසලාකදෙමි සංඝයා සිහි නොකොට මිරිස් වැටියක් අනුභව කළෙමි. ඊට දඬුවම් වේවයි චෛත්‍ය සහිත වූ අතිශයින් සිත්කළු වූ මිරිසවැටිය වෙහෙර කරමියි එය සංඝ තෙමේ පිළිගන්නා සේක්වා යි කියා සතුටු සිත් ඇත්තා වූ හෙතෙම දක්ෂිණෝදකය වගුරුවා ඒ විහාරය භික්ෂු සංඝයාට පවරා දුන්නේ ය.



Scanned with CamScanner

මහාවිහාරය බිහි වී අවුරුදු 217 මාස 10 ක් දින 10 ක් ගිය තැන තවත් මහාවිහාරයක් ලෙස අභයගිරි විහාරය පිහිටුවන ලදී.[35] එම විහාරයේ නිර්මාතෘවරයා වශයෙන් මහාවංසයේ සඳහන් වන්නේ ක්‍රි.පූ. 89 දී ලංකාවේ රජ පැමිණි වට්ටගාමිණී අභය රජු ය.[36] වංසකතාවන්ට අනුව අභයරාම[37], අභයුත්තර[38] යනුවෙන් ද ශිලා ලේඛනයන්හි අභයගිරි විහර[39] යනුවෙන් ද මෙම විහාරය හඳුන්වා ඇත. වට්ඨගාමිණී අබය රජු ගිරි නම් නිගණ්ඨයා විසූ ආරාමය කඩා බිඳ දමා එහි ඉදි කළ විහාරය අභයගිරිය නම් වූ බව වංසකතාවල සඳහන් වේ.[40] අභයගිරි විහාරය ආරම්භ කරනු ලබන්නේ නගරයේ උතුරු ප්‍රදේශයේ වන අතර මීට පෙර ඉදි වූ බෞද්ධ විහාරයන් මෙන් නොව මෙම විහාරය ආගමික හා පෞද්ගලික හේතුමත මහාවිහාරයෙන් වෙන් ව ගිය භික්ෂූන් කණ්ඩායමක් විසින් ආරම්භ කරනු ලැබේ. විශේෂයෙන් ම ක්‍රි.පූ සිවු වැනි ශත වර්ෂයේ දී පණ්ඩුකාභය රජතුමා නිගණ්ඨ පූජකයින් සඳහා සාදා දුන් ජෛන ආරාම පැවති භූමියේ අභයගිරි ස්තූපය හා ආරාම සංකීර්ණය ඉදි කරන බැවින් වෙනත් ආගමික සිද්ධස්ථානයක් සඳහා වෙන් කෙරුණු භූමියක් බෞද්ධ ආගමික සිද්ධස්ථානයක් ගොඩනැංවීම සඳහා භාවිත කිරීම තුළින් එම භූමිය එතෙක් ක්‍රියාත්මක භූ දර්ශනය වෙනස් කිරීමට හේතු වී ඇති බව පෙනේ. අනුරාධපුර නගරයෙන් උතුරෙහි ක්‍රි.පූ. පළමු වැනි සියවසේ දී ආරම්භ වන මෙම විහාරය පසු ව අනුරාධපුර රාජධානි සමය අවසන දක්වා වර්ධනය වී අක්කර 500 ක් දක්වා ව්‍යාප්ත ව ඇත.[41] අභයගිරි විහාරයේ භූ දර්ශනය වේගවත් ලෙස සංවර්ධනය වූයේ එයට රාජ අනුග්‍රහය ලැබුණ නිසා ය. අභයගිරියේ භික්ෂු සංඛ්‍යාව වැඩිවත් ම ඇමතිවරුන් අභයගිරි විහාරයට පූජා කරන ලද සංඝාරාම නගරයට දකුණු දෙසට වන්නට පිහිටා තිබුණි.[42] එම විහාරය දක්ෂිණ විහාරය විය. අභයගිරිය හා දක්ෂිණගිරි විහාරය ථේරවාදී සම්ප්‍රදාය නොව මහායාන සම්ප්‍රදාය අනුගමනය කරන ලද ධම්මරුචි හා සාගලීය නිකායනන්ට අයත් වූ බව මූලාශ්‍රයවල සඳහන් වේ. අමණ්ඩගාමිණී අභය (ක්‍රි.ව. 22-31) රජු මාගම දකුණු දිග වැව කරවා දක්ෂිණ විහාරයට පිදූ බව සඳහන් වීමෙන් රජවරුන්ගේ අනුග්‍රහය එම විහාරවලට නොමදව ලැබී ඇති බව පැහැදිලි වේ. දක්ෂිණගිරි විහාරය වට්ටගාමිණී අභය රජුගේ උත්තිය නැමති යෝධයා විසින් කරවා මහාතිස්ස හිමිට පූජා කරන ලද බව මහාවංස ටීකාවේ සඳහන් වේ.[43]

මහාවිහාර සැලැස්මේ සුවිශේෂ විහාරයක් වන්නේ අභයගිර විහාරයයි. අභයගිරි විහාරයේ සැලැස්ම සැකසීමේ දී එය මූල ක්‍රමයක් මත වර්ධනය වූ බවට සාක්ෂ්‍ය ඇත. දහස් සංඛ්‍යාත භික්ෂු ගණයක් එක් එක් මූල තුළ අභිප්‍රේත වූ බව විමල් ජී.බලගල්ලේ පෙන්වා දී ඇත (බලගල්ලේ 1995:445). අභයගිරියේ මූල හතරක් ක්‍රියාත්මක වූ බව මූලාශ්‍රයවල ද සඳහන් වේ. උත්තර මූල හා වාදුමූල මානවම්ම රජු විසින් සිය සෙහොයුරා සඳහා අභයගිරි විහාරයේ ඉදි කළ මූලය බව සඳහන් වේ.[44] Vවැනි මිහිඳු රජුගේ (ක්‍රි.ව.956-972)

---

35 වික්‍රමගමගේ, චන්ද්‍රා, අභයගිරි සම්ප්‍රදාය, අපේ සංස්කෘතික උරුමය (ප්‍රථම කාණ්ඩය), සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය, මධ්‍යම සංස්කෘතික අරමුදල, 1995, 111 පිට.

36 මහාවංසය, පරි.32-35.

37 දීපවංසය, පරි.12, ගාථා 14.

38 මහාවංසය, පරි.35 , ගථා 119.

39 **Epigraphia Zeylanica, Vol.I**,Eed. Wikramasingha D.M.D.Z, London, Oxford University Press, 1912, P.154.

40 මව. 33, 45, දිව, 13, 83.

41 කුලතුංග, 1998, 313 පිට.

42 වික්‍රමගමගේ, 1995, 112 පිට.

43 තෙසු සත්තසු යොධෙසු උතතියො නාම කාරයි
නගරමහා දකඛිණතො විහාරං දකඛිණ විහයං(වංසපකා. 33,88)

44 මහාවංසය, පරි.60, ගාථා 20, පූජාවලිය, 20.



Scanned with CamScanner

අභයගිරි පුවරු ලිපියේ උතුරුමූල පිළිබඳ ව සඳහන් ව ඇත.[45] II වැනි සේන රජු විසින් උත්තරොළ්හ පිරිවෙණෙහි ප්‍රාසාදයක් කළ බව සඳහන් වේ.[46] මහනෙත් ප්‍රාසාද මූලයIV වැනි අක්බෝ (ක්‍රි.ව.18-24) ඉදි කරවා අභයගිරි ධම්මරුචි භික්ෂූන්ට ප්‍රදානය කර තිබේ.[47] Vවැනි කසුප් රජුගේ අභයගිරි ලිපියෙහි ද මහනෙත්ප්‍රාසාදමූල හා වාදූමූලය සඳහා සම්මත කළ චාරිත්‍ර පිළිබඳ ව සඳහන් වීම තුළින් එම මූලවල ක්‍රියාකාරිත්වය අවබෝධ කරගත හැකි ය.[48] මූලාශ්‍රයවල සඳහන් වන කරුණු අනුව අභයගිරි විහාරය හා ඒ ආශ්‍රිත සැලැස්ම නගරයේ උතුරු අක්ෂයේ දී මූල පදනම් කර ගනිමින් වර්ධනය වී ඇති ආකාරය හඳුනාගත හැකි ය. මෙම මූල පසු කලක දී විශ්වවිද්‍යාලයක පීඨ බවට පරිවර්තනය වූ බව ෆාහියන් වැනි විදේශීය භික්ෂූන් අභයගිරි විහාරයට පැමිණීමෙන් තහවුරු වේ.

අභයගිරි විහාරයේ ගොඩැගිලි එහි විශාලත්වය පදනම් කර ගනිමින් සමූහ වශයෙන් කොටස් 4 ක ට බෙදීගිය බව පෙනේ. V වැනි කසුප් රජතුමාගේ හා IV වන මහින්ද රජතුමාගේ ශිලා ලිපිසාධක අනුව හා සාහිත්‍යමය තොරතුරුවලින් අනාවරණය වන කරුණු අනුව උත්තර මූල, කපරාමූල, මහනෙත්පා මූල, වාදූමූල, නම් මූල හතරකට කට අභයගිරි විහාරය බෙදී තිබුණ බව පෙනේ. එම විශේෂ අංග පිළිබඳ ව V වැනි කසුප් රජතුමාගේ (ක්‍රි. ව 914 - 923) අභයගිරි පුවරු ලිපියේ" **අබහය් වෙහෙර ඉසා පිළිමගෙයි ඉසා දාගැබ් හි ඉසා, මහා බෝ ගෙයි ඉසා, රුවන් පහා හි බගෙයි ඉසා......**"යනුවෙන් සඳහන් වේ. මේ ස්ථාන අද බොහොමයක් නිවරදි ව හඳුනාගෙන ඇත.[49] අභයගිරි විහාරය තුළ වූ මූල හතරට තවත් මූල හතරක් එකතු වී " **අෂ්ඨායනය**" හෙවත් "**අටමූල**" ක්‍රියාත්මක වූ බව විමල් ජී. බලගල්ලේ සඳහන් කරයි. ඉහත සඳහන් මූල හතරට ට අමතරව මූල ලෙස **දක්ඛිණමූල, සෙල්ලක්කර මූල, සරෝගා මූල, සේනාපති මූල,** අයත් වේ.[50]බෞද්ධ ශාසනික ඉතිහාසය අතින් බලන විට මෙකී අෂ්ඨ ආයතන ලක්දිවෙහි ම උපත ලබා සීඝ්‍රයෙන් විකාශයට පත්ව සියවස් කිහිපයක් ඇතුළත අවසන් ව ගිය බව පෙනේ. දහස් ගණන් භික්ෂූන් ට නිවාසස්ථාන වූ තිස්සාරාමය, අභයගිරි ආදී මහාවිහාරවල නැතහොත් තදනුබද්ධ ව පිහිටි සියගණන් අනේවාසික භික්ෂු සමූහයා සහිත කීර්තිමත් ආචාර්යවරුන් හෝ රාජපූජිත මහා තෙරුවන් හෝ විසූ ආවාස මුල්කර ගෙන නේවාසික භික්ෂු සංඛ්‍යාව අතින් ද ගොඩනැගිලි ප්‍රත්‍ය පහසුව අතින් ද ක්‍රමයෙන් දියුණු වීමේ හා රාජ්‍ය අනුග්‍රහ යේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම මූල ආයතනයන් පහළ වන්නට ඇතැයි සිතිය හැකි ය[51].

ප්‍රතිපත්ති මාර්ග වශයෙන් හෝ අධ්‍යාපනාදි නියුක්ති වශයෙන් හෝ ඇති සමානතාව සමානාධ්‍යශයනාව, ඈත අතීතයේ දී සිට ම විශාල භික්ෂු ගණනක් සමූහයක් වශයෙන් එක් කොට බැඳ තබන්නට අනුරාධපුර අවසාන භාගයේ දී පොදු පිළිවෙතක් මගින් හෝ අධ්‍යාපනිකාදි පොදු අරමුණකින් හෝ බැඳුණු මෙබඳු භික්ෂු සමූහ හැඳින්වුණු ජනප්‍රිය නාමය වූයේ "මූල" යන්නය. ආයතනවල මූලාරම්භය වෙන වෙනම සිදු වූ බවත්, සෑහෙන කාලයක් තුළ අනුක්‍රමයෙන් සිදු වූ දියුණු වූ හා උසස් ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපන මධ්‍යස්ථාන වශයෙන් හෝ ගුණ ගරුක මහා තෙරුවන්ගේ නිවාසස්ථාන වශයෙන් ද රාජාදී ප්‍රභූජනයා ඇතුළු බහු ජනයාගේ සාදර ගෞරවයට පාත්‍ර වීමේ ප්‍රතිඵලයක් ලෙස අනුරාධපුර අවසාන

45 E.Z.Vol.I, P.21.
46 මහාවංසය, පරි.69, ගාථා 75.
47 මහාවංසය, පරි.64, ගාථා 2.
48 E.Z.Vol.I, P.21.
49 කුලතුංග, 1998, 322 පිට.
50 බලගල්ලේ, ජී. අෂ්ඨායතන හෙවත් අට මූල, අපේ සංස්කෘතික උරුමය (ද්විතීය භාගය), කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, ආගමික කටයුතු අමාත්‍යාංශය, 1998, 448-53 පිටු.
51 එම, 445 පිට.



Scanned with CamScanner

භාගයවන විට සමහරක් ආයතන තත්ත්වය ලැබසිටි බව පෙන්වන සාධක ඇත. අභිලේඛන හා වංසකතාමය සාධක අනුව ආයතන අටක් පැවති බව පෙනේ[52].

අභයගිරි විහාරයේ පැවති මූල ආයතන හතර වන උත්තර මූල, මහානෙත්පා මූල, කපරා මූල, වාදූ මූල යන ආයතනවලට සම්බන්ධ වූ මූල දෙකක් ජේතවනාරාමය සතුව පැවති බව බලගල්ලේ ගේ අදහස වේ. ඔහු පවසන අන්දමට මහවංසයේ එන, නගරයේ දකුණු අක්ෂයට බටහිර දෙසින් දක්ෂිණ විහාරය නිර්මාණය කෙරුණේ මීළඟ ප්‍රධාන මහාවිහාරය ලෙස ය.[53] මූලාශ්‍රයවල සඳහන් වන ආකරයට මහාවිහාරය සමඟ ඇති වූ වෙනස්කම්වලට විරෝධය දැක් වූ අභයගිරිය විහාරික භික්ෂු කණ්ඩායමක් දෙවැනි වරට එතැනින් වෙන් ව ගිය අතර ඔවුන් සඳහා රජතුමා දක්ෂිණ විහාරයේ ස්තූපයක් හා ආරාමය ගොඩනැගී ය. මේ අනුව මහාවිහාරයටත්, අභයගිරියටත් යන අන්ත දෙකට ම සම්බන්ධ නොවී මධ්‍යම මාර්ගයන් ගත් තුන්වැනි කණ්ඩායමක් ද ඇති විය[54]. පුරාණ අනුරාධපුර නගරයේ භූ දර්ශනය සඳහා එක්වන්නා වූ මහාවිහාරවලින් අවසාන විහාරය වූයේ ජේතවනයයි. ක්‍රි.ව. 276-303 අතර කාලයේ දී මහසෙන් රජතුමා විසින් මෙම විහාරය ඉදිකරන ලද බව මහාවංසය, නිකාය සංග්‍රහය හා සද්ධර්මාලංකාරයේ සඳහන් වේ. එම විහාරය මහාවිහාර සීමාව ඇතුළත වූ බව ද මූලාශ්‍රයවල සඳහන් වේ [55]. ජේතවන මහාවිහාරය ඉදි කරන ලද්දේ ද පණ්ඩුකාභය රජු කාලවේල නම් යක්ෂයා සඳහා දෙවොල තැන වූ ස්ථානය බව රෝලන්ඩ් සිල්වා ප්‍රකාශ කර තිබේ[56]. නමුත් හේම රත්නායක පෙන්වා දී ඇත්තේ ජේතවන විහාරය මිහිඳු මහරහතන් වහන්සේ ධර්මය දේශනා කළ ස්ථානය වන ජෝරානම්බන්ධ මාලක වශයෙන් ව්‍යවහාර වූ පසු ව මිහිඳු මහරහතන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අනතුරු ව උන්වහන්සේගේ දෙන ආදාහණය කළ භූමිය වූ **ඉසිභූමංගන** යනුවෙන් හැඳින්වූ භූමියේ ඉදිකරන ලද විහාරය වන බවයි.[57] කෙසේ වුවත් ඓතිහාසික වශයෙන් සලකන කළ ථේරවාදී නිකායත්‍රයේ වර්ධනයේ දී ජේතවනාරාමය වැදගත් තැනක් උසුලයි. ඉන්දීයානු ලේඛනවල සාගලීය හෝ **ජේතවනවාසීන්** යනුවෙන් ද සිංහල සාහිත්‍ය මූලාශ්‍රයවල සහ සෙල්ලිපිවල **දෙනානක** යනුවෙන් ද මෙම විහාරය හඳුන්වා ඇත.[58] ක්‍රි.පූ. තුන් වැනි සියවසේ සිට ක්‍රි.ව. තුන් වැනිසියවස අවසාන දක්වා සියවස් හයක් තුළඅනුරාධපුරයේ වර්ධනය වන මහාවිහාර සැලසුමට අයත් විහාර පහ පහත සඳහන් භූ දර්ශනය මත ගොඩනැගී තිබුණ බව සේනක බණ්ඩාරනායක පෙන්වා දී ඇත.

i. ස්තූපය (කේන්ද්‍රය)

ii. විවෘත භූමිය

iii. පූජනීය අංගනය (පොහොයගෙය, පඨිමාඝරය, ධර්මශාලාව, සභාශාලාව, සන්නිපාතශාලාව, බෝධිඝරය)

iv. නේවාසික අංගනය (ලැගුම් ගෙවල්, දානශාලා, කැසිකිළි වැසිකිළි, දිය පොකුණු, නාන පොකුණු)[59]

---

52 එම, 446 පිට.

53 Silva 2000, P.57.

54 එම, 57 පිට.

55 එකල මහසෙන් රජ ...........සීමාව ඇතුළත දෙනා වෙහෙර කරවා කොහොන්තිස්ස මහතෙරුවන්ට දන්දිනි (සද්ර.30-37;නිස. 15)

56 Silva, 2000, P. 57.

57 රත්නායක, 1998, 331 පිට.

58 එම, 331 පිට.

59 Bandaranayake, 1974, PP. 30-57.



Scanned with CamScanner




(Bandaranayake1974:30-57)

**මහාවිහාර සැලසුම් ආරෙහි වාස්තුවිද්‍යාත්මක අංග ස්ථානගත වීම සම්බන්ධව බණ්ඩාරනායක දක්වා ඇති භූ දර්ශනයෙහි සැලසුම**

මහාවිහාර තුළ අන්තර්ගත මෙම සැලසුම් ආරට අයත් භූ දර්ශනය නිර්මාණය වී ඇත්තේ ඒ ඒ විහාරාරාම තුළ අන්තර්ගත ඉඩ සැලසුම්කරණය පදනමින් බව විහාර ආශ්‍රිත භූමි ප්‍රමාණ අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. මහාවිහාරය, අභයගිරිය, ජේතවනය, යන විහාරයන් තුනෙහි වර්තමාන සැලසුම පරීක්ෂා කිරීමේ දී වඩාත් පැහැදිලි ව පෙනෙන කාරණය වන්නේ ජේතවනාරාම විහාර සැලසුම යම් තාක් දුරට අභයගිරි විහාර සැලසුමට සමානතාවයක් දක්වන බවයි. මෙහි දී අවධානය යොමු කළ යුතු කාරණයක් වන්නේ විහාර දෙකේ පවතින ඉඩ සැලසුම්කරණය පදනම් කර ගනිමින් ගොඩනැඟිලි ස්ථානගත කර ඇති අයුරු පිළිබඳ ව ය. අභයගිරි විහාරය අක්කර 500 ක පමණ භූමි භාගයක ව්‍යාප්ත වන බව දැනට පිළිගැනෙන අතර ජේතවනාරාමය අක්කර 200 කපමණ භූමි භාගයක ව්‍යාප්ත වූ බව පිළිගැනේ. මේ අනුව විහාර භූමි දෙකෙහි පවත්නා විෂමතා ව පැහැදිලි වන අතර, ඉඩ සැලසුම්කරණය අතින් අභයගිරි විහාරය ප්‍රමුඛස්ථානයක් ගනී. ඒ සඳහා විහාරය ව්‍යාප්තවීමට ඇති භූමියේ ප්‍රමාණය විශාල කිරීමට අභයගිරි විහාරයට ඉඩ තිබුණ අතර, ජේතවන භූමිය තුළ විහාර ස්ථාපනය කිරීමේ දී එක් පසකින් මල්වතු ඔයෙන් ද අනෙක් පසින් මහාවිහාර හා ඇතුළුනුවර යන සීමාවලින් ද සීමාවී තිබීම මත විහාර භූමිය සැලසුම් කිරීමෙන් අනතුරු ව වැඩි ව්‍යාප්තියක් දැකගත නොහැකි ය. නමුත් විහාර දෙකේ ම විශේෂත්වය වන්නේ විශාල ස්තූප කේන්ද්‍රගත කරමින් ආරාමීය අංග ගොඩනගා තිබීම වේ.



Scanned with CamScanner

කෙසේ වෙතත් අනුරාධපුරය ඇසුරින් බිහිවූ මහාවිහාරය, මිරිසවැටිය, අභයගිරිය, දක්ෂිණගිරිය සහ ජේතවනාරාමය ක්‍රමයෙන් වර්ධනය වූ පැරණි තම ආරාම ප්‍රභේදය වශයෙන් පිළිගැනේ.[60] විශේෂයෙන් ම මහාවිහාරවල සැලසුම අධ්‍යනයේ දී එහි ප්‍රධාන වාස්තුවිද්‍යා අංග කොටස් දෙකක් යටතේ නිර්මාණය වී ඇති බව පෙන්වා දීය හැකි ය. එම ප්‍රධාන අංග දෙක නම්,

1. ආගමික වාස්තුවිද්‍යා අංග
2. නේවාසික වාස්තුවිද්‍යා අංග වශයෙනි.

ආරාම සංකීර්ණයේ වාස්තුවිද්‍යා අංගෝපාංග ස්තූපය වටා සැලසුම් කර ඇති අතර, පහත දැක්වෙන පරිදි ස්ථානගත වී ඇත. බෝධිඝරය, උපෝසතඝරය, සන්නිපාත ශාලාව විවෘත භූමියට පිටතින් ඇත. ඊටත් පිටතින් නේවාසික අංගනය ස්ථානස්ථාන ගත වී තිබේ. විහාර සැලස්ම තුළ අන්තර්ගත වන ආගමික අංග අතරට,

1. ස්තූපය
2. ධර්ම ශාලාව
3. පොහොයගෙය
4. බෝගෙය
5. පිළිමගෙය
6. සභාශාලාව පෙන්වා දීය හැකි ය.

එසේ ම නේවාසික අංග අතරට,

1. දාන ශාලාව
2. පිරිවෙණ් හෙවත් සංඝවාස (ප්‍රාසාද)
3. පොකුණු හා ළිං
4. ජන්තාඝර
5. වැසිකිලි හා කැසිකිලි වැනි අංග පෙන්වා දීය හැකි ය.

මහාවිහාර සතු ව පැවතිය යුතු මෙම මූලික පූජනීය හා නේවාසික අංග පිළිබඳ ව මංජු ශ්‍රී වාස්තුවිද්‍යා ශාස්ත්‍ර යේ දක්වා ඇත්තේ ආරාමයක සියළු ම ගොඩනැගිලි " මුඛ්‍ය" සහ " ගෞණ" යනුවෙන් කොටස් දෙකකට අයත් වන බව ය. " මුඛ්‍ය" හෙවත් ප්‍රධාන ගොඩනැගිලි පස් වැදෑරුම් වේ. ඒවා නම් චෛත්‍යය, බෝධිවේෂ්මය, ප්‍රතිමාලය, සහ සභා යන අතිශයින් පූජනීය ගොඩනැගිලි සතරත් වේ. භික්ෂූන් වහන්සේලාගේ වාසභවන වූ ප්‍රාසාදයන් හා ආරාමයේ පිහිටි සෙසු ගොඩනැගිලි "ගෞණ" යන ඝණයට අයත් වූ බව වාස්තුවිද්‍යා ශාස්ත්‍ර යේ පැහැදිලි කරයි. වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ ප්‍රාසාද යන වචනය ආගමික ගොඩනැගිලි හා භික්ෂූන් වහන්සේලා ජීවත් වූ විහාර ශාලා හැඳින්වීම සඳහා භේදයෙන් තොර ව යොදනු ලැබ ඇත. ඇතැම් විට ඕනෑ ම ගොඩනැගිල්ලක් සඳහා ප්‍රාසාදය යන වචනය භාවිතා කරනු ලැබ ඇත. එහෙත් වාස්තුවිද්‍යා ශාස්ත්‍රය පැහැදිලි ව සඳහන් කරන්නේ ප්‍රාසාදය භික්ෂූන් වහන්සේලාගේ නේවාසිකාගාරය වශයෙන් ය.[61]

60 එම, 14 පිට.
61 මාරසිංහ, 1993, 30-31 පිට.

මංජු ශ්‍රී භාෂිත වාස්තුශාස්ත්‍රයට අනුව ආරාම නිර්මාණයේ දී නිශ්චිත සැලසුමක් පදනම් කර ගනිමින් ඒවා නිර්මාණ කළ බවට මූලික සාක්ෂ්‍ය ලැබේ. මෙහි මූලික පදනම වශයෙන් ගැනෙනු යේ **වාස්තු මණ්ඩලය** නමින් හැඳින්වෙන ගුප්ත භූමි සටහනකි. මෙම භූමි මණ්ඩලය එහි දී **කෝෂ්ඨ** නවයකට බෙදනු ලැබේ. කෝෂ්ඨ නවයකින් යුත් වාස්තු මණ්ඩල පීඨ වශයෙන් හැඳින්වේ. වාස්තුශාස්ත්‍රයේ ආරාම විදි දොළහෙන් හයක් පිහිටා ඇත්තේ පීඨ වාස්තු මණ්ඩලය අනුව ය. එම සැලසුම් අතරින් **සිංහාරාම** සැලැස්ම පීඨ සැලැස්ම අනුව සැලසුම් කර තිබේ. වාස්තු මණ්ඩලයක කිසියම් කෝෂ්ඨයක් එයට අධිගෘහිත දේවතාවාගේ නමින් හඳුන්වනු ලැබේ[62]. එමපීඨ හෙවත් කෝෂ්ඨවල බෙදීම මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ මෙසේ පෙන්වා දී ඇත.[63]

| | | |
|---|---|---|
| වායු | සෝම | ඉස |
| වරුණ | බ්‍රහ්ම | ආදිත්‍ය |
| නිරිත | යම | අග්නි |

**පීඨ සැලැස්ම**

මංජු ශ්‍රී වාස්තුවිද්‍යා ශාස්ත්‍රය ට අනුව ආරාමයක ගොඩනැගිලි හා කෝෂ්ඨ වෙන් කිරීමේ දී පිළිපැදිය යුතු ප්‍රධාන නීතියක් නම් එක් ගොඩනැගිල්ලක එක් කෝෂ්ඨයකට පමණක් සීමා විය යුතු අතර, එහි සීමා උල්ලංඝණය නොකළ යුතු වීම යි. යම් හෙයකින් අසල් වැසි කෝෂ්ඨයක් ආක්‍රමණය කරනු ලැබුව හොත් ඉන් ලැබෙන විපාක භයානක වනු ඇත. පීඨ සැලැස්මක ඇත්තේ කෝෂ්ඨ නවයකි. එක් කෝෂ්ඨයක ගොඩනැගිලි එකකට වඩා ඇතුළත් කිරීමට සිදු වනු ඇත. එහෙත් මෙහි දී පවා හැකි සෑම විටම එක් කෝෂ්ඨයක් එක් ප්‍රධාන ගොඩනැගිල්ලක් සඳහා පමණක් වෙන් කිරීමට වග බලා ගෙන ඇත.[64] මංජු ශ්‍රී වාස්තුවිද්‍යා ශාස්ත්‍ර යේ සඳහන් ආරාම සැලසුම් පිළිබඳ අධ්‍යනයේ දී විශේෂයෙන් ම පීඨ සැලසුම පිළිබඳ ග්‍රන්ථ කතුවරයා එතරම් විස්තරයක් දක්වා නැති අතර පීඨ සැලසුම මහාවිහාර සම්ප්‍රදායට අයත් ලෙස විස්තර කිරීමට උත්සාහ කර ඇති බව ග්‍රන්ථයේ සඳහන් සිංහාරාම සැලසුම පීඨ සැලැස්මට අයත් බව දක්වා තිබීමෙන් පෙනේ. එසේ ම පීඨ සැලැස්ම තුළ ගොඩනැගිලි ස්ථානගත කිරීමේ දී කෝෂ්ඨ සඳහා එතරම් බලපෑමක් ලබාදීමට කතුවරයා පෙළඹී නැති අතර එයින් ගම්‍ය වන්නේ එම ග්‍රන්ථය රචනා කරන කාලය වන විට අනුරාධපුර මහාවිහාර පහම ඉදි වී අවසන් බැවින් මහාවිහාර සැලසුම සඳහා කතුවරයා යම් ලිහිල් බවක් දක්වා ඇති බව ය.

62 මාරසිංහ, 1993, 30 පිට.
63 Mvs, PP. 215 - 216.
64 මාරසිංහ, 1983, 30 පිට.



Scanned with CamScanner

අනුරාධපුරයෙහි තිබූ මහාවිහාරයට පමණක් මහාවිහාර යන නම නොයෙදිණි. ක්‍රි.ව දස වැනි සියවසේ දී පමණ අනුරාධපුර රාජධානිය අවුල් වියවුල් වූ කාලයේ ලංකාවේ අනෙක් පාළාත්වල ද මහාවිහාර යනුවෙන් සඳහන් විහාර තිබුණි. පස් වැනි දප්පුල( ක්‍රි.ව 923 - 934) රජුගේ සය වැනි අවුරුද්ද සඳහන් වන කතරගම සෙල් ලිපියේ මහාවිහාරය යන වචනය සඳහන් වේ. නිසැකව ම මෙයින් අදහස් කරන්නට ඇත්තේ තිස්සමහාරාමයයි. රසවාහිනියට අනුව අරියගාල තිස්ස නම් මිනිසෙක් භික්ෂූන්ට ආරාධනා කිරීමට රෝහණයේ මහාවිහාරයට ගොස් ඇත. මෙය බොහෝ විට තිස්සමහාරාමය විය හැකි ය. නව වැනි ශතවර්ෂයට අයත් මන්නාරම් කච්චේරියේ ඇති ටැම් ලිපියක මහාවිහාර යේ බහදුරුසෙන් පියංගල නම් ආරාමයකට දුන් පූජා ගැන සඳහන් වේ[65]. කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි කෝරලයේ ගොන්නෑව දේවාලයේ තිබෙන දසවැනි ශත වර්ෂයට අයත් ටැම් ලිපියක මහාවිහාරයේ ඇති ඉඩමක් ගැනද සඳහන් වේ[66]. මේ ටැම් ලිපිවල දැක්වෙන මහාවිහාර යන වචනයෙන් ගැනෙන්නේ මහාවිහාරය ද අනුරාධපුර යේ මුල් ස්ථානයට අයත් ඇතැම් ප්‍රාදේශික විහාරයන් ද නො එසේනම් ඒ ඒ පළාත්වල මහාවිහාර නමින් හැඳින්වුන විහාරයක් දැයි නිශ්චිතව ම අපි නොදනිමු. මහාවිහාර යන ප්‍රසිද්ධ නාමය ප්‍රාදේශික ආරාමයක් හැඳින්වීමෙන් පසුව යොදා ගන්නට ඇත.[67]

## සමාලෝචනය

මහාවිහාර යන විහාරාරාම වර්ගය ක්‍රි. ව 3 වැනි සියවස සිට ක්‍රි. ව 9 වැනි සිය වස දක්වා කාලය තුළ දී විවිධ වචනාර්ථවලින් යුක්ත ව භාවිතා වී ඇත. කෙසේ වෙතත් ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් වන තොරතුරු අනුව මහාවිහාර යන්න මුලින් ම භාවිත කර ඇත්තේ අනුරාධපුර මහාවිහාරයට බව පැහැදිලි වේ. එබැවින් එම ව්‍යවහාරය අනුගමනය කර සැලසුම් ගත කර ඉදි වූ විහාරාරාම පසුව මහාවිහාර යන සම්ප්‍රදායට තැනුන වෙහෙර ලෙස උපකල්පනය කළ හැකි ය. ශ්‍රී ලංකාවේ වාස්තුවිද්‍යාවේ ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී ථේරවාදී මහාවිහාර සම්ප්‍රදාය අනුගමනය කරමින් මෙරට බිහි වූ අවසන් මහාවිහාර වන්නේ මහනුවර රාජධානි සමයේ ඉදි වූ අස්ගිරිය මහාවිහාරය හා මල්වතු මහාවිහාරය බව පෙන්වා දීය හැකි අතර මෙම විහාර මුලින් ඉදි කරන සමයේ දී මහින්ද මහාරහතන් වහන්සේ අනුරාධපුර මහාවිහාරය ඉදි කිරීමේ දී අනුගමනය කරන ලද ක්‍රමය වන රජ මාළිගාවේ සිට දුණු 500 දුරින් මෙම උභය විහාර දෙක මහනුවර රාජධානි සමයේ දී ස්ථාපිත කර තිබෙන බව රෝලන්ඩ් සිල්වා ප්‍රකාශ කර තිබේ. ඒ අනුව මහාවිහාර වාස්තුවිද්‍යා සැලැස්මේ අවසන් ස්ථාවර බව අපට හඳුනාගත හැකි වන්නේ අස්ගිරිය හා මල්වතු මහාවිහාර ඇසුරින් බව මේ අනුව පෙන්වා දීය හැකි අතරම මහාවිහාර සැලැසුම් ආර ඉතා දිගු කලක සිට මහනුවර රාජධානි සමය දක්වා අඛණ්ඩව පැවතී ඇති බව මේ අනුව පෙන්වා දීය හැකි අතර ම භූ ගෝලීය හා පාරසරික කරුණු අනුව මහනුවර දී එයට අනන්‍යව ගොඩනැගී ඇති බව පෙන්වා දීය හැකි ය.

---

65 **E.Z.** Vol. III, P. 103.
66 **E.Z**, Vol. IV, PP.188 -89
67 රාහුල, 1989, 317 පිට.

Scanned with CamScanner




ජේතවන මහාවිහාරයේ සැලැස්ම



අනුරාධපුර මහාවිහාර සැලැස්ම ගුවනට දිස්වන ආකාරය



Scanned with CamScanner



අභයගිරි මහාවිහාරයේ භික්ෂූන් නේවාසිකව සිට ඇති සංඝාරාමයක්

Scanned with CamScanner